# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 63/5 — 1973 ජූනි 12 වැනි අඟහරුවාදා — 1973.06.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

### ආණ්ඩුවේ නිවේදන

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතෙහි 10 වන හා 25 වන වගන්ති සමග කියවිය යුතු එම පනතේ 30 වන වගන්තිය යටතේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යවරයා විසින් සාදනු ලැබ එම පනතේ 30 (3) වගන්තිය යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝග :

රිජ්වේ තිලකරත්න,
ලේකම්,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය.

1973.06.11.

1. මේ නියෝග 1973 ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල (සාමාන්‍ය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මණ්ඩලය අවශ්‍ය යැයි සලකන කරුණු සම්බන්ධයෙන් මණ්ඩලය අවශ්‍ය යැයි සලකන වාර වාර්තා හා තොරතුරු මණ්ඩලය වෙත සපයන ලෙස මණ්ඩලය විසින් භාර දෙනු ලබන දැන්වීමකින් යම් පුවත්පතක අයිතිකරුට, මුද්‍රණකරුට, ප්‍රකාශකට හෝ පත්‍ර කලාවේදියාට නියම කරනු ලැබූ විට ඒ වාර්තා හා තොරතුරු ඒ දැන්වීමෙහි විධාන කොට ඇති ආකාරයට හෝ සිලිටවලට ඒ අයිතිකරු හෝ වෙනි සඳහන් කෙස නැනැත්තන් විසින් මණ්ඩලයේ ලේකම්වරයාගේ ලිපිනයට තැපැල් කොට මණ්ඩලය වෙත සැපයිය යුතුය.

3. එකී සෑම වාර වාර්තාවක් ම හෝ තොරතුරක් ම මණ්ඩලය විසින් නියම කරනු ලබන පිටපත් සංඛ්‍යාවක් සමග මණ්ඩලය විසින් නියම කරනු ලබන දින ගණන ඇතුළත දී සැපයිය යුතු ය.

4. මණ්ඩලයේ ඉහත කී දැන්වීම් එය අදාළ තැනැත්තාගේ ලිපිනයට ගෙන ගොස් දීමෙන් හෝ ලියා පදිංචි තැපෑලෙන් ඒ තැනැත්තා වෙත යැවීමෙන් හෝ ඒ තැනැත්තා වෙත භාර දිය යුතු ය.

5. එවැනි තැනැත්තකු වෙත යවනු ලබන එවැනි සෑම දැන්වීමක් හෝ වෙන යම් ලිඛිත ඉල්ලීමක් ඒ තැනැත්තාගේ නමට හෝ පදවි නාමයට නැතහොත් ඒ දෙකට ම යොමුකර යැවිය හැකි ය.

6. මේ නියෝග ක්‍රියාත්මක වී දින 30 ක් ඇතුළත ද ඉන් පසු එක් එක් වර්ෂයේ ජනවාරි 31 වන දිනට හෝ ඊට පෙර ද සෑම පුවත් පතක් ම විසින් ඒ පුවත් පතෙහි අයිතිකරුගේ, මුද්‍රණකරුගේ, ප්‍රකාශකගේ, කර්තෘගේ සහ සියලු ම ක්‍රියාකාරී පත්‍ර කලාවේදීන්ගේ නම් ඇතුළත් වාර වාර්තාවක්, එම වාර්තාව එවන දින පවත්නා පරිදි පිළියෙළ කොට මණ්ඩලය වෙත සැපයිය යුතු ය.

7. 6 වන නියෝගය යටතේ සපයනු ලැබූ විස්තර කලින් කල වෙනස් වන අවස්ථාවල දී, එවැනි වෙනස්වීමක් ඇති වී දින 7 ක් ඇතුළත ඒ වෙනස් වීම පිළිබඳව මණ්ඩලයට දැන්විය යුතු ය.

8. මේ නියෝග යටතේ මණ්ඩලය වෙත සැපයීමට නියම කර ඇති සියලු ම වාර වාර්තා හෝ තොරතුරු ද මේ නියෝග යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන හෝ ඉදිරිපත් කිරීමට නියමිත සියලු ඉල්ලීම් ද මණ්ඩලයේ ලේකම් වෙත ලිපිනය කොට මණ්ඩලය වෙත සැපයිය යුතු ය. නැතහොත් ඉදිරිපත් කළ යුතු ය.

9. පුවත් පතක සෑම අයිතිකරුවකු හා සෑම කර්තෘවරයකු විසින් මේ නියෝග ක්‍රියාත්මක වූ දිනයෙහි සිට දින දහහතරක් ඇතුළත ද එකී දිනයට පසුව පුවත් පතක අයිතිකරුවකු හෝ කර්තෘවරයකු බවට පත්වන සෑම තැනැත්තකු විසින් ඒ අයිතිකරු හෝ කර්තෘවරයා බවට පත්වීමෙන් පසු දින දහහතරක් ඇතුළත ද අවස්ථාවෝචිත පරිදි අයිතිකරු වශයෙන් නැතහොත් කර්තෘවරයා වශයෙන් සවකීය නම් ලියා පදිංචි කරවා ගැනීම සඳහා මණ්ඩලය වෙත එවන වෙන ම ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු ය. එකී සෑම ඉල්ලීමක් ම ඉන් පසුව පැමිණෙන එක් එක් වර්ෂයේ ජනවාරි තිස් එක් වන දිනට පෙර අලුත් කළ යුතු ය.

10. 9 වන නියෝගය යටතේ ඉදිරිපත් කෙරෙන සෑම ඉල්ලීමක ම අයිතිකරු පේ සහ කර්තෘගේ සම්පූර්ණ නම ද පුවත්පතේ නම ද ඇතුළත් විය යුතු ය. තව ද එම පුවත් පතේ ලියා පදිංචි කළ ලිපිනය සහ අයිතිකරුගේ හා කර්තෘගේ පෞද්ගලික ලිපිනය ද එම ඉල්ලුම් පතෙහි ඇතුළත් විය යුතු ය.

11. අයිතිකරුගේ නම ලියාපදිංචි කිරීම සඳහා හෝ එම ලියාපදිංචි කිරීම අලුත් කිරීම සඳහා හෝ ඉල්ලුම් කරන පුවත් පතක සෑම අයිතිකරුවකු ම විසින් එකී ඉල්ලුම් පතක් සමග රුපියල් සියයක (රු. 100) ගාස්තුවක් ගෙවිය යුතු ය.

12. ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනතේ යම්කිසි විධිවිධානයක් කඩකර ඇති බවට හෝ එය යටතේ වරදක් කර ඇති බවට ද ඒ නමින් ඒ කාර්යයට හෝ වරද සම්බන්ධයෙන් ක්‍රියා කර නැති බවට ද යම් පැමිණිල්ලක් කරනු ලබූ අවස්ථාවක හෝ වෙනත් ආකාරයකින් ඒ කරුණු අමාත්‍යවරයාට දැන ගැනීමට ලැබුණු අවස්ථාවක, අවශ්‍ය වන්නා වූ හා පනතට අනුකූල වූ ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස අමාත්‍යවරයා විසින් පුවත් පත් මණ්ඩලයට විධාන කළ හැකි ය.

13. සියලු ම ගාස්තු, පරිත්‍යාග, තෑගි හෝ මුදලෙන් ලැබෙන සියලු ආදායම ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයට ගෙවිය යුතු ය.

6-734/1

---

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනතෙහි 9 වන වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 30 වන වගන්තිය යටතේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යවරයා විසින් සාදනු ලැබ එම පනතේ 30 (3) වගන්තිය යටතේ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝග :

රිජ්වේ තිලකරත්න,
ලේකම්,
ප්‍රවෘත්ති හා ගුවන් විදුලි අමාත්‍යාංශය.

1973. 06. 11.

1. මේ නියෝග 1973 ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල (විභාග) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනතේ 9 වන වගන්තිය අනුව මණ්ඩලය වෙත කරනු ලබන සෑම පැමිණිල්ලක් ම ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු අතර, අසත්‍ය වූ ප්‍රකාශයක් හෝ විකෘති කළ චිත්‍රයක් හෝ අනිසි දෙයක් පුවත් පතක් විසින් පළ කොට ඇති බව හෝ පුවත් පතක කර්තෘවරයකු හෝ ක්‍රියාකාරී පත්‍ර කලාවේදියකු විසින් යම් වෘත්තීය විෂමාචාරයක් හෝ පත්‍ර කලාවේදී ආචාර ධර්ම සංග්‍රහය කඩ කිරීමක් හෝ කර ඇති බව ඒ පැමිණිල්ලෙන් දත් විය යුතු ය.

3. මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරෙන පැමිණිල්ල පිටපත් දෙකකින් මණ්ඩලයේ ලේකම්වරයා වෙත සැපයිය යුතු ය. එම පිටපත් ලියාපදිංචි තැපැලෙන් යැවිය යුතු ය. නැතහොත් මණ්ඩලයේ කාර්යාලය වෙත ගෙන ගොස් භාර දී, එම පිටපත් ලැබුණු බවට ලියවිල්ලක් ලබා ගත යුතු ය.

4. ඉහත සඳහන් පැමිණිල්ල ලේකම් වෙත ලැබුණු පසු, සාධාරණ වශයෙන් බලාපොරොත්තු විය හැකි තරම් ඉක්මණින් එම පැමිණිල්ල ඔහු විසින් මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

5. (I) එසේ ඉදිරිපත් කරනු ලැබූ විට මණ්ඩලය විසින් පැමිණිල්ල සලකා බැලිය යුතු අතර ඒ පැමිණිල්ල සම්බන්ධයෙන් විභාගයක් පැවැත්විය යුතු යයි සිතීමට මණ්ඩලයට හේතු ඇතහොත්, පුවත් පත් මණ්ඩල පනතේ විධිවිධාන යටතේ මණ්ඩලය විසින් පවත්වනු ලබන විභාගය පැවැත්වෙන දිනය, වේලාව හා ස්ථානය පිළිබඳව, මෙහි III වන උපලේඛනයෙහි නියමිත දැන්වීම, පැමිණිල්ල කරනු ලැබ ඇත්තේ යම් පාර්ශ්වයකට විරුද්ධව ද (මෙහි මින් මතු විත්තිකරු වශයෙන් සඳහන් කරනු ලබන) ඒ පාර්ශ්වය වෙත කිරීමට, මණ්ඩලය ලේකම්වරයාට විධාන කළ යුතු ය.

(2) මණ්ඩලය විසින් මණ්ඩලයේ ම ඕනෑකම පිට විභාගයක් ආරම්භ කරන අවස්ථාවක මණ්ඩලය හා ලේකම්වරයා මේ නියෝගවල (I) වන ඡේදයෙහි විධිවිධාන අනුව ක්‍රියා කළ යුතු ය.

6. විභාගය පවත්වනු ලබන දිනය ඒ දිනයට යටත් පිරිසෙයින් දින 14 කට වත් කලින් මණ්ඩලය විසින් අදාළ පාර්ශ්වයන්ට දැනුම් දිය යුතු ය.

7. (අ) මණ්ඩලය විසින් විභාගයට නියම කර ඇති කාරණය පිළිබඳ ව කිසිම අධිකරණයක නඩු කටයුත්තක් පැවැත්වීමට නියමිතව නොමැති බවට, පැමිණිල්ල කරන පාර්ශ්වය (මින් මතු පැමිණිලි කරු යැයි කියනු ලබන) විසින් සමාදාන විනිශ්චය කාරවරයකු ඉදිරියේ කරන ලද ප්‍රකාශයක්, ඉහත සඳහන් පැමිණිල්ල මණ්ඩලයට ඉදිරිපත් කරන වේලාවේ දී හෝ එසේ නැති නම් විභාගය සඳහා නියම කර ඇති වේලාවට යටත් පිරිසෙයින් පැය 48 කට කලින් හෝ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.

(ආ) විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7 කට වත් කලින් පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරනු ලබන සාක්ෂිකරුවන්ගේ සහ ලේඛණවල ලැයිස්තුවක් මණ්ඩලයේ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. ඒ ලැයිස්තුවේ පිටපතක් ඒ සමඟ ම විභාගයට සම්බන්ධ අනෙක් පාර්ශ්වය වෙත ද භාර දිය යුතු ය. මණ්ඩලයේ අවසරය නොමැති ව, ලැයිස්තුවකට ඇතුළත් නොකරන ලද කිසිම සාක්ෂිකරුවකු කැඳවීමට හෝ ලේඛණයක් ඉදිරිපත් කිරීමට කිසිම පාර්ශ්වයකට අවකාශ නොලැබෙන නමුදු ස්වකීය අභිමතය පරිදි එසේ ලැයිස්තුවකට ඇතුළත් නොකරන ලද යම් තැනැත්තකු, සාක්ෂිකරුවකු වශයෙන් කැඳවීමට හෝ යම්කිසි ලේඛණයක් ඉදිරිපත් කරවීමට මණ්ඩලයට හැකි ය.

(ඇ) යම් පාර්ශ්වයකගේ විභාගය සඳහා අවශ්‍ය වන යම්කිසි සාක්ෂිකරුවකුට කැඳවීමේ නියෝගයක් නිකුත් කිරීම සඳහා ඉල්ලීමට ඒ පාර්ශ්වයට අවකාශ ඇත්තේ ය. කැඳවනු ලබන තැනැත්තාගේ ගමන් හා අනෙකුත් වියදම් ගෙවීමට ප්‍රමාණවත් වන පරිදි, මණ්ඩලයේ අනුමැතිය ඇතිව කොමසාරිස් විසින් තීරණය කරනු ලබන වියදම් හා එවැනි ගාස්තු ගෙවනු ලැබූ විට මෙහි 1 වන උපලේඛණයේ දැක්වෙන නියමිත ආකෘති පත්‍රයෙහි, මණ්ඩලයේ අභිමතය පරිදි හා විධානය පිට ලේකම්ගේ අත්සනින් යුතු ව කැඳවීමේ නියෝගයක් නිකුත් කළ යුතු ය. ඒ කැඳවීමේ නියෝගය ලියාපදිංචි තැපෑලෙන් හෝ වෙනත් යම්කිසි මාර්ගයකින් හෝ කැඳවනු ලබන පාර්ශ්වයේ ලිපිනයට ගෙන ගොස් භාර දිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් යවන ලද කැඳවීමේ නියෝගය ලිපිනයට භාර නොදී ආපසු එවන ලැබූ අවස්ථාවල දී හැර, ලියාපදිංචි තැපෑලෙන් යැවීම කැඳවිය යුතු තැනැත්තා වෙත කැඳවීමේ නියෝගය භාරදීම ලෙස සලකනු ලැබේ.

8. යම්කිසි විභාගයක් සිය අභිමතානුකූල ව, යම් වේලාවක දී කල් තැබීමට හෝ යම්කිසි විභාග යක් පැවැත්වීම කල් තබන ලෙස පැමිණිලිකරු හෝ විත්තිකරු වෙනුවෙන් කරන ලද කවර ඉල්ලීමකට වුව ද ඉඩ දීමට හෝ ඉඩ නොදීමට හෝ එවැනි අවස්ථාවල දී වියදම් ආදී කරුණු මණ්ඩලය තීරණය කරන පරිදි නියම කිරීමට හෝ මණ්ඩලයට සම්පූර්ණ බලය ඇත්තේ ය.

9. මණ්ඩලය විසින් පවත්වනු ලබන යම්කිසි විභාගයක දී, කොමසාරිස්වරයා විසින් හෝ පමිණිලිකරු විසින් හෝ මණ්ඩලය විසින් පැමිණිල්ල ආරම්භ කරන අවස්ථාවකදී කොමසාරිස්වරයා විසින් පෞද්ගලිකව ම හෝ උත්තරවාදියකු මගින් හෝ යථා පරිදි ලිඛිත අනුමැතියකින් බලය පවරන ඕනෑම නියෝජිතයකු මඟින් හෝ විත්තිකරුට විරුද්ධව ඉදිරිපත් කැරෙන චෝදනා ඉදිරිපත් කොට, පැමිණිලිකරු හෝ කොමසාරිස් පිටුබල කර ගන්නා වාචික හෝ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය. මණ්ඩලය විසින් හෝ පැමිණිලිකරු විසින් ආරම්භ කරනු ලබන පැමිණිල්ල ඔප්පු කරනු සඳහා කැඳවනු ලබන සාක්ෂිකරුවන්ගෙන්, අධිකරණයක නඩු විභාගයකදී කරන්නාක් මෙන් සාක්ෂි විභාග කිරීම හරස් ප්‍රශ්න ඇසීම හා නැවත ප්‍රශ්න ඇසීම කළ හැකි ය. එසේ වුව ද සාක්ෂි නීතිය හෝ සිවිල් සහ අපරාධ නඩු විධාන සංග්‍රහය හෝ තාරයේ අනුගමනය කරනු නොලැබේ.

10. විත්තියෙන් කරුණු විමසීම අනවශ්‍ය යැයි මණ්ඩලය කල්පනා කරතොත් මිස, පැමිණිලි කරුගේ පැමිණිල්ල විභාග කිරීම හෝ මණ්ඩලය විසින් ආරම්භ කරනු ලබන විභාගය අවසන් වූ පසු හෝ මණ්ඩලය විසින් නියම කරනු ලබන වෙනත් දිනයක හෝ විත්තිකරුවන්ට ඉදිරිපත් කිරීමට ඇති කරුණු ඉදිරිපත් කර, වාචික හෝ යම්කිසි ලේඛනමය සාක්ෂි ඇතොත් ඉදිරිපත් කළ යුතු ය. ඉහත 9 වන නියෝගය යටතේ මෙන් සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි විභාග කිරීම හරස් ප්‍රශ්න ඇසීම හා නැවත ප්‍රශ්න ඇසීම් ද කළ හැකි ය.

11. අදාළ වන පරිද්දෙන් පැමිණිලිකරුට, විත්තිකරුට, කොමසාරිස්ට හෝ උත්තර වාදියාට හෝ නියෝජිතයකුට, නඩුවට අදාළ කරුණු සම්බන්ධයෙන් හෝ නීතිය මත හෝ මණ්ඩලය ඇමතීමට මණ්ඩලයේ අභිමතය පරිදි අවස්ථාවක් දිය හැකි ය.

12. රහස්‍ය විභාගයක් පැවැත්විය යුතු බවට කරුණු තිබේ නම්, සිය මෙහෙයවීමෙන් ම හෝ පැමිණිලිකරු විසින් හෝ විත්තිකරු විසින් හෝ කොමසාරිස් විසින් අයදුම් කළවිට ස්වකීය අභිමතය පරිදි එසේ කිරීමට මණ්ඩලයට හැකි ය.

13. (අ) යම්කිසි විභාගයක් සම්බන්ධයෙන් යම්කිසි පාර්ශ්වයකට අයවිය යුතු ගාස්තු ගෙවීමේ හෝ නොගෙවීමේ සම්පූර්ණ අභිමතය මණ්ඩලය සතු වන්නේ ය. ගාස්තු ප්‍රමාණය විභාගය පැවැත්වෙන එක් දිනයක් සඳහා හෝ විභාගය පැවැත්වීමට නියමිතව ඇති එක් දිනයක් සඳහා යම්කිසි පැමිණිලි කරුවකුට හෝ යම්කිසි විත්තිකරුවකුට පෞද්ගලික ව පෙනී සිටීම සම්බන්ධයෙන් රු. 100 ක් හෝ කොමසාරිස් පෙනී සිටින එවැනි යම්කිසි දිනකට රු 210 ක් හෝ උත්තර වාදියෙකු හෝ නියෝජිතයෙකු පෙනී සිටින එවැනි එක් දිනකට රු. 1,050 ක් හෝ නොඉක්ම විය යුතු ය. එක් උත්තර වාදියෙකුට වැඩියෙන් පෙනී සිටින විට, යම්කිසි උත්තරවාදියකු හෝ උත්තරවාදීන් වැඩි ගණනක් සඳහා වියදම් ගාස්තු සීමා කිරීමේ අභිමතය මණ්ඩලය වෙත පැවරේ.

(ආ) යම්කිසි විභාග කටයුත්තකදී ඉදිරිපත් කරනු ලැබ ගොනු ගතකොට ඇති ලේඛන වල පිටපත් හෝ විභාග කටයුතු වාර්තා පිටපත් හෝ පැමිණිලිකරු හෝ විත්තිකරු යන කවර පාර්ශ්වය කට හෝ අවශ්‍ය වන අවස්ථාවලදී පැමිණිලිකරු හෝ විත්තිකරු හෝ ඔහුගේ උත්තර වාදියා හෝ බලය ලත් නියෝජිතයා හෝ ඒ සඳහා ලේකම් වෙත ඉල්ලුම් කළ යුතු ය. එසේ ඉල්ලුම් කරනු ලැබූ විට වචන 120 ක පිටක් ශත 85 බැගින් රු. 2.55 ක අවම ගාස්තු ප්‍රමාණයක් ද, ඡායාරූප, චිත්‍ර, චිකට් චිත්‍ර සහ එවැනි දෑ සඳහා 6"×4" ප්‍රමාණයට රු. 2.50 ක් ද, 8"×6" ප්‍රමාණයට රු. 3.50 ක් ද, 10"×12" ප්‍රමාණයට රු. 7.50 ක් ද වන සේ එවැනි සෑම ලේඛණයකට ම අය කරනු ලැබේ.

14. යම්කිසි විභාගයක දී සාක්ෂි දෙන සෑම සාක්ෂිකරුවකුටම සාක්ෂි දීමට පෙර, දිවුරුමක් හෝ සහතික ප්‍රකාශයක් හෝ කරන ලෙස නියම කළ යුතු ය.

15. සෑම විභාගයක ම වාර්තාවක් සටහන් කරවා ගෙන එය සිය භාරයේ තැබීමට මණ්ඩලය ක්‍රියා කළ යුතු ය. ඒ වාර්තාවට අංකයක් යොදා පැමිණිලිකරු හෝ මණ්ඩලය සහ විත්තිකරු අතර වූ කාරණයක් ලෙස ශීර්ෂ පාඨ යෙදිය යුතු අතර, මුලින් ම පැමිණිල්ල ලැබුණු දිනයේ හෝ ආරම්භ කරන ලද දිනයේ සිට විභාගය අවසන් වන තෙක් වූ සියලුම විධිවිධි ඇතුළත් කාර්ය පත්‍රිකාවක් ද ඊට ඇතුළත් විය යුතු ය.

16. පැමිණිලිකරුට හෝ කොමසාරිස්වරයාට හෝ විත්තිකරුට හෝ කවර වූ හෝ පාර්ශ්වයකට එසේ වාර්තා කර ඇති විභාග කටයුතු වාර්තාවෙහි ලේකම් විසින් සහතික කරන ලද පිටපතක් ලේකම් වෙත අයදුම් කර මණ්ඩලය විසින් නියම කොට ඇති ගාස්තු ගෙවා මණ්ඩලයෙන් ලබා ගැනීමට හිමිකම ඇත්තේ ය. එවැනි පිටපත් ලබා ගැනීමට කොමසාරිස්වරයා කිසිම ගාස්තුවක් ගෙවිය යුතු නොවන්නේ ය.

17. විත්තිකාර පාර්ශ්වය විසින් විභාගයට අවශ්‍ය සියලු කරුණු ඉදිරිපත් කරන ලැබීමෙන් පසුව හෝ මණ්ඩලය අදාළ පාර්ශ්වයන්ට දැනුම් දෙන එවැනි වෙනත් දිනයක දී, අවස්ථාවෝචිත පරිදි පැමිණිලිකරු හෝ කොමසාරිස්වරයා පැමිණිල්ල පිළිබඳව මණ්ඩලය සෑහීමට පත් කිරීමේ භාරය ඉටු කිරීමට අපොහොසත් නොවුවහොත්, මෙහි IV වන උපලේඛණයේ දක්වා ඇති ආකෘතියෙහි හෝ ඊට සාරානුකූල වූ ආකෘති පත්‍රයක 9 වන වගන්තිය ප්‍රකාර ස්වකීය නියමය හෝ දෝෂාරෝපණය කළ යුතු ය.

18. (අ) යම්කිසි විභාගයක දී යථා පරිදි දැනුම් දීමෙන් පසුව විත්තිකරුවකු විභාගයක් සඳහා පෙනී නොසිටින අවස්ථාවල දී හෝ විභාගය පවත්වන කාලය මුළුල්ලේ ම පෙනී සිටීම අතපසු කරන හෝ පැහැර හරින අවස්ථාවල දී විත්තිකරු නොමැතිව ම මණ්ඩලය විභාගය පවත්වා හෝ විභාගය පවත්වාගෙන ගොස් අවස්ථාවෝචිත පරිද්දෙන් පැමිණිලිකරු හෝ කොමසාරිස් වරයා පැමිණිල්ලේ කරුණු පිළිබඳව මණ්ඩලය සෑහීමට පත් කිරීමේ භාරය ඉටු කිරීමට අපොහොසත් වුවහොත් මිස, ස්වකීය නියමය හෝ දෝෂාරෝපණය කළ යුතු ය.

(ආ) පැමිණිලිකරු විභාගයක් සඳහා ඉදිරිපත් වීම පැහැර හැරිය විටක, පැමිණිලිකරු නොසිටියදී ම පැමිණිල්ල සලකා බැලීමටත් පැමිණිලිකරු පැමිණ සිටින විටක දී නීතියට අනුව ගනු ලැබිය යුතු අවශ්‍ය වූද, උචිත වූද සියලුම පියවරවල් ගැනීමටත් මණ්ඩලයට හැකි ය.

19. ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනතේ 9 වන වගන්තිය යටතේ කරනු ලබන සෑම නියම යකට ම හෝ දෝෂාරෝපණයකටම සභාපති සහ විභාගයට පැමිණි සිටි මණ්ඩලයේ සියලු ම සාමාජික යන් අත්සන් කළ යුතු අතර එයට මණ්ඩලයේ ලේකම් විසින් මණ්ඩලයේ මුද්‍රාව තබා, ලේකම්ගේ අත්සන මුද්‍රාවට යටින් තබා නිවැරදි බවට සහතික කළ යුතු ය.

20. යම් නැගැන්තක, පුවත් පත් මණ්ඩල පනතේ 12 වන වගන්තිය යටතේ යම් අපහාස වරදක් කර ඇති බව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවක, මෙම නියෝගවල II වන උපලේඛනයේ දක්වෙන ආකෘතියෙහි හෝ ඊට සාරානුකූල වූ ආකෘතියක, සහතිකයක් මණ්ඩලයේ ලේකම් ලවා දෙසාධිකරණය වෙත යැවීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය හැකි ය.

21. මණ්ඩලය විසින් නිකුත් කරන සෑම කැඳවීම් නියෝගයක් ම මේ නියෝගවල I වන උපලේඛනයේ දක්වෙන ආකෘතියෙහි හෝ ඊට සාරානුකූල වූ ආකෘතියක විය යුතු ය.

22. මණ්ඩලය විසින් ඒ අවස්ථාවේදීම වාර්තාගත කරන ලබන යම් සාධාරණ හේතූන් නිසා, ඉහත දක්වුණු නියෝග වලින් නියමිත විභාග පරිපාටියෙන් බැහැරවීමට මණ්ඩලයට හැකි ය.

23. මේ නියෝග අනුව යම් දැන්වීමක්, ලැයිස්තුවක්, චාර වාර්තාවක්, තොරතුරු හෝ වෙනත් ලේඛනයක් යැවිය යුතු, සැපයිය යුතු, ගොනු කළ යුතු, දිය යුතු හෝ ගෙන ගොස් භාරදිය යුතු සෑම අවස්ථාවක දීම, වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්නම් මිස, එය ලියාපදිංචි තැපෑලෙන් යැවීම ප්‍රමාණවත් වේ.

24. මේ නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍යවුවහොත් මිස :

(අ) පැමිණිලිකරු, විත්තිකරු, කොමසාරිස් හෝ මණ්ඩලය යන වචන වලට පැමිණිලිකරු, විත්තිකරු, කොමසාරිස් සහ මණ්ඩලය වෙනුවෙන් පෙනී සිටින උත්තරවාදියකු හෝ බලය ලත් නියෝජිතයකු ද ඇතුළත් විය යුතු ය.

(ආ) පාර්ශ්වය හෝ පාර්ශ්ව යන වචනවලින් පැමිණිලිකරු, විත්තිකරු, කොමසාරිස්වරයා හෝ ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනතේ 9 වන වගන්තිය යටතේ මණ්ඩලය පැමිණිල්ල මෙහෙය වන විට, මණ්ඩලය අදහස් වේ.

(ඇ) ලේකම් යන්නෙන් මණ්ඩලයේ ලේකම් අදහස් වේ.

## 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත

### I වන උපලේඛනය

### ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේදිය

පැමිණීම හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීම සඳහා II වන විගන්තිය යටතේ. පුද්ගලයකුට යවන කැඳවීම් නියෝගය

අංකය :..................................

(නම) :....................................................

(ලිපිනය) :...............................................

යථෝක්ත පුවත් පත් මණ්ඩල පනතේ විධිවිධාන යටතේ පැවැත්වීමට නියමිත ව ඇති විභාගයක දී සාක්ෂිදීමට සහ/හෝ මෙහි පහත සටහන් ඇති ලැයිස්තුවේ සඳහන් ලේඛන ඉදිරිපත් කිරීමට මණ්ඩලයේ කාර්යාලයට පැමිණෙන ලෙස පැමිණිලිකරුගේ/විත්තිකරුගේ මණ්ඩලයේ මෙහෙයවීම පිට මෙයින් ඔබට නියම කරමි.

..............................වන දින පෙ. ව./ප. ව..................ට එකී කාර්යාලයේ දී ඔබ පෙනී සිටිය යුතු ය.

හේතුවක් නොමැතිව, මෙහි සඳහන් වේලාවට මණ්ඩලය ඉදිරියේ පෙනී සිටීමට හෝ මෙහි සටහන් ඇති ලැයිස්තුවේ ලේඛන ඉදිරිපත් කිරීමට හෝ අපොහොසත්වීම, 1973 අංක 5 දරන පුවත් පත් මණ්ඩල පනතේ 12 වන විගන්තිය යටතේ අපහාස වරදක් වන්නේ ය.

මණ්ඩලයේ නියමය පරිදි,
**ලේකම්.**

(මණ්ඩලයේ ලිපිනය) :..............................

දිනය :..............................................

**සැලකිය යුතුයි :**

ඔබගේ ගමන් හා අනිකුත් වියදම් සඳහා රු.          ක මුදලක් මණ්ඩලයේ තැන්පත් කොට ඇත.

## 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත

### II වන උපලේඛනය

### ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේදිය

12 (2) වන විගන්තිය යටතේ සහතිකය

අංකය :..................................

197...................... මස ................. දින හෝ තදාසන්න කාලයේ දී.....................

...................... විසින්,

කරන ලද හෙයින් ද,

ඒ හේතුකොටගෙන යථෝක්ත.................................................... විසින් මණ්ඩලයේ බලයට විරුද්ධවීමේ හෝ අගෞරව කිරීමේ වරද කර ඇති බව මණ්ඩලය නිශ්චය කර ඇති හෙයින් ද,

යථෝක්ත ........................................................................ විසින් ඉහත සඳහන් 12 වන විගන්තියේ ඇතුලත් පාඨයේ අර්ථානුකූල වූ අපහාස කිරීමේ වරද කරන ලදැයි යන මණ්ඩලයේ නිශ්චය කිරීම මණ්ඩලය මෙයින් සහතික කරයි.

සභාපති.

ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කරන ලද්දේ

..................................
(මුද්‍රාව)

..................................
(ලේකම්)

**විසිනි.**

මණ්ඩලයේ ලිපිනය :..................................

දිනය :..................................................

**1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත**

III වන උපලේඛනය

**ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩලයේදිය**

චිත්තිකරුට දැන්වීම

අංක :..............................

නම සහ ලිපිනය :..........................

..............................
චිත්තිකරු

..................................................ලදැයි පැමිණිල්ලක් මණ්ඩලය වෙත ලැබී ඇති හෙයින්/විශ්වාස කිරීමට මණ්ඩලයට හේතු ඇති හෙයින්.

2. ......................මස.........වන දින පෙ. ව/ප.ව ......ට පහත සඳහන් ලිපිනය දරන ස්ථානයේ පිහිටා ඇති ස්වකීය කාර්යාලයේ දී මණ්ඩලය විසින් විභාගයක් පවත්වනු ලබන බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

3. පෞද්ගලිකව ම හෝ උත්තරවාදියකු මාර්ගයෙන් හෝ නිසි පරිදි ලියවිල්ලකින් බලය පවරන ලද අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ යථෝක්ත විභාගයේ දී පෙනී සිටීමට ඔබට අයිතිය තිබේ.

4. ඔබගේ නිදහසට කරුණු ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා, සාක්ෂිකරුවකු වශයෙන් හෝ යම් ලියවිල්ලක් ඉදිරිපත් කරවා ගැනීම සඳහා හෝ යම්කිසි පුද්ගලයකු පමුණුවා ගැනීම ඔබට අවශ්‍ය නම් 19......................මස.........දින ගැසට් පත්‍රයේ/අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ 1973 ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල (විභාග) නියෝගවල විධිවිධාන ප්‍රකාර ඒ සඳහා ඉල්ලුම් කරන මෙන් ඔබට නියම කරනු ලැබේ.

මණ්ඩලයේ නියමය පරිදි,
ලේකම්.

මණ්ඩලයේ ලිපිනය :..............................

..............................

දිනය :......................................

**1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත් පත් මණ්ඩල පනත**

IV වන උපලේඛනය

**ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේදිය**

අංකය :..............................

නියමය/දෝෂාරෝපණය :

(ලිපිනය) පදිංචි, (නම) වන චිත්තිකරු අසත්‍ය වූ ප්‍රකාශයක් හෝ විකෘති කළ චිත්‍රයක් හෝ අනිසි දෙයක් පුවත් පතක පළකොට ඇති බවට නැතහොත් වෘත්තීය විෂමාචාරයක් හෝ පත්‍ර කලාවේදී ආචාර ධර්ම සංග්‍රහය කඩ කිරීමක් සිදුකර ඇති බවට පැමිණිල්ලක් වූ හෙයින් ද,

පුවත් පත් මණ්ඩලය මගින් එකී චෝදනාව සම්බන්ධයෙන් විභාගයක් පවත්වා, පනතේ 9 වන වගන්තිය අනුව නියමයක් හෝ දෝෂාරෝපණයක් කිරීම අවශ්‍ය යැයි සෑහීමකට පත්ව සිටින හෙයින් ද,

මෙහි පහත සඳහන් නියමය/දෝෂාරෝපණය මණ්ඩලය විසින් කරනු ලැබේ:—

එසේ ම ඉහත නම් සඳහන් විත්තිකරු විසින් "..................................." නමැති පුවත් පතේ පළමෝත්ත නිවැරදි කිරීම/සමාව ගැනීම/දෝෂාරෝපණය මණ්ඩලය මගින් තීරණය කර ඇති පහත සඳහන් ආකාරයට පළ කළ යුතු බව මණ්ඩලය තවදුරටත් මෙයින් නියෝග කරයි.

1. ..............................................

(සාමාජික)

2. ..............................................

(සාමාජික)

3. ..............................................

(සාමාජික)

4. ..............................................

(සාමාජික)

5. ..............................................

(සාමාජික)

6. ..............................................

(සාමාජික)

..............................................

සභාපති.

..............................................

(මුද්‍රාව)

ලේකම්ගේ අත්සන.

මණ්ඩලයේ ලිපිනය :.................................

.................................

දිනය :...................................

6—734/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.